## ශ්‍රී ලංකා මහ බැංකුව - 2012

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.3,535,285 ක් වූ අවිනිශ්චිත ගිණුම් දෙකක ශේෂයන් ගිණුම්වල සසඳා නිරවුල් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 16 අනුව, වයිට් අවේස් ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩමේ අගය ඉඩම් යටතේ ගිණුම්ගත කරනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි. වයිට් අවේස් ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩමේ අගය රු. මිලියන 400 ක්විය.

(ඇ) මුදල් නීති පනතේ 39 වගන්තිය ප්‍රකාර , විසර්ජනයන් සහ ශ්‍රී ලංකා රජය වෙතින් වන හිඟ පියවීමෙන් පසු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපයන ලද ලාභය,මූල්‍ය වර්ෂයක් අවසන් වී දින 60 ක් ඇතුලත මහා භාණ්ඩාගාරය වෙත මාරු කළ යුතුය.එසේ වුවත් මුදල් නීති පනතේ නියමයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් රු. බිලියන 33 ක මුදලක් 2012 ජුනි,ඔක්තෝබර්, දෙසැම්බර් මාස වලදී කලින් ගෙවීම් ලෙස මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි.මූල්‍ය ප්‍රකාශන අනුව රු. බිලියන 25.2 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය සැලකිල්ලට ගත් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව රු. බිලියන 66.2 ක ලාභයක් උපයා තිබුණි. ඊට අමතරව 2012 දෙසැම්බර් 31 දිනට රු. බිලියන 1.35 ක මුදලක් ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතුව තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින්,

(i) ගරු නීතිපතිතුමාගේ උපදෙස් මත එසේ ලාභය මාරු කළ බවත්, වර්ෂය ඇතුලත විගණිත උපලබ්ධි ලාභයෙන් මාරු කිරීම පිළිබඳ විශේෂිත සීමාවක් මුදල් නීති පනතේ නොමැති බවත්,

(ii) කාර්තු පදනම මත උපලබ්ධි ලාභය පිළිබඳ විශේෂ බාහිර විගණනයක් සකස් කරන බවත්, කලින් ලාභය මාරු කිරීමේ ප්‍රතිඵලය එම විගණිත කාර්තුමය උපලබ්ධි ලාභයට එක එල්ලේ වන බලපෑම, වර්ෂයේ විගණිත වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල මුළු ලාභය මාරු කිරීම අවසන් කිරීමට යටත්ව බවත් මා වෙත දැනුම් දෙන ලදී.

(ඇ) මුදල් නීති පනතේ 39 (බී) වගන්තිය ප්‍රකාර මුළු කොටස්හිමියන්ගේ හිමිකම, මුළු වත්කම් , රන් හා විදේශ මුදල් වත්කම් අතර වෙනස ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 15 අඩු නොවිය යුතුය.පසුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂපත්‍රය ශක්තිමත් කිරීමට සහ රටේ ආර්ථික තත්වය සලකා එම අනුපාතය සියයට 100 දක්වා වැඩිකිරීමට 2010 දෙසැම්බර් 13 දින මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි.එසේ වුවත් සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් මණ්ඩලය තීරණය කර තිබූ එම අනුපාතය පවත්වාගෙන ගොස් නොතිබුණි.සියයට 100 අවශ්‍යතාවයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන ගිය අනුපාතය සියයට 51 සිට සියයට 60 අතර පරාසයක පැවතුණි. මුදල් නීති පනතින් ගිවිසගත් සියයට 15 අනුපාතයට අමතරව,ප්‍රාග්ධන අවශ්‍යතාවයේ අභ්‍යන්තර මෙහෙයුම උදෙසා ස්වේච්ඡා මිණුමක් ලෙස මුදල් මණ්ඩලය විසින් කලින් කලට මෙම ප්‍රාග්ධන අනුපාතය නියම කරනු ලබයි. එසේ වුවත් 2014 රජයේ අයවැයෙන් යෝජනා කළ පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාග්ධනය රු. බිලියන 50 දක්වා වැඩිකිරීමේ අදහසින් එම ප්‍රකාශිත ස්වේච්ඡා අනුපාතය අවලංගු කිරීමට සහ සෑම වර්ෂයකම මුල්‍ය ප්‍රකාශන අනුමත කරන අවස්ථාවේදී එවන් අනුපාතයක් වාර්ෂිකව නියම කිරීමට සලකා බැලීමට, විචක්ෂණභාවයෙන් යුතු නව සිද්ධියක් හේතුවෙන් අමතර ප්‍රාග්ධනය අවශ්‍ය වුවහොත් එම අයවැය යෝජනා ක්‍රියාත්මක කිරිම සඳහා මුදල් නීති පනතට කරනු ලබන සංශෝධන කෙටුම්පත් දැනටමත් මුදල් අමාත්‍යාංශය වෙත ලබා දී තිබූ බව ශ්‍රී ලංකා මහ බැංකුව පැහැදිළි කරන ලදී.

1.2.2 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලංකා ඛණිජ තෙල් සංස්ථාව වෙනුවෙන් නීතිපතිතුමාගේ ඉල්ලීම පරිදි පසුගිය වර්ෂයන් ඇතුලත නීති ගාස්තු වශයෙන් විදේශික නීතිඥයන්ට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවා තිබූ රු. මිලියන 480.8 ක මුදල වර්ෂ 2 කට වැඩි කාලයක් තිස්සේ අයකරගෙන නොතිබුණි. 2013 වර්ෂය අවසානය වන විට එසේ අයකරගත යුතුව තිබූ මුදල රු.මිලියන 333.1 ක් බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් මා වෙත දැනුම් දෙන ලදී.

(ආ) නැවත ගෙවිය යුතු ටෙන්ඩර් ගාස්තු, සුළු ණයහිමියෝ සහ කොන්ත්‍රාත්තු රඳවාගැනීම් රු. 2,739,898 ක ප්‍රමාණයක් වර්ෂ 5 කට වැඩි කාලයක් පාලන ගිණුමක තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම ශේෂය සඳහා සැපයුම්කරුවන් විසින් හිමිකම්පෑමක් කර නොතිබුණු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එය ආදායමට මාරු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය ඉකුත් වර්ෂයේ අනුරූපී ශුද්ධ ලාභය වූ රු.මිලියන 46,830 හා සැසඳීමේදී රු.මිලියන 66,209 ක ශුද්ධ ලාභයක් වූ අතර එය මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන19,379 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.ඉකුත් වර්ෂයේ රු.මිලියන 3,577 ක ලාභය සමග සැසඳීමේදී ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය රු.මිලියන 25,182 ක් සහ ඉකුත් වර්ෂයේ රු.මිලියන 227 ක ශුද්ධලාභය සමග සැසඳීමේදී දේශීය මූල්‍ය වත්කම් වලින් ලද ශුද්ධ ආදායම රු.මිලියන 24,866 සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය වැඩිවීමට හේතු විය.

2.2 විග්‍රහත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

ඉකුත් වර්ෂයේ රු.බිලියන 3.5 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය ඇතුලත්ව රු.බිලියන 53 ක මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ රු.බිලියන 25.1 ක ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය ඇතුලත්ව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම වූ රු. බිලියන 75.9 මුළු ශුද්ධ මෙහෙයුම් ආදායමේ සියයට 43 ක වැඩිවීමක් නියෝජනය කරයි.එහෙත් ඉකුත් වර්ෂයේ ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් ඇතුලත්ව රු.බිලියන 5.5 ක මෙහෙයුම් වියදම සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ එය රු.බිලියන 7.1 ක් විය. එය සියයට 29 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.සමාලෝචිත වර්ෂය තුල ශ්‍රී ලංකා මහ බැංකුවේ ආදායමේ සහ වියදමේ වෙනස්කම් ඉකුත් වර්ෂය සමග සසඳා පහත දැක්වේ.

| | 2012 | 2011 | වෙනස | |
|---|---|---|---|---|
| | රු.බිලියන | රු.බිලියන | රු.බිලියන | % |
| විදේශ මූල්‍ය වත්කම් වලින් ආදායම | 28.6 | 52.4 | (23.8) | (45) |
| විදේශ මූල්‍ය වගකීම මත වියදම | 3.7 | 3.9 | (0.2) | (5) |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය | 25.1 | 3.5 | 21.6 | 617 |
| දේශීය මූල්‍ය වත්කම් වලින් ආදායම | 24.8 | 0.2 | 24.6 | 12,300 |
| මෙහෙයුම් වියදම | 7.1 | 5.5 | 1.6 | 29 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | 66.2 | 46.8 | 19.4 | 41 |

ඉකුත් වර්ෂය සමග සැසදීමේදී දේශීය මූල්‍ය වත්කම් වලින් වූ ආදායම සැළකියයුතු ලෙස වැඩිවී තිබියදීත්, ඉකුත් වර්ෂය සමග සැසදීමේදී විදේශ මූල්‍ය වත්කම් සියයට 45 කින් අඩු වී ඇති බව නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධති ස්ථායිතාවය පිළිබඳ ක්‍රියාකාරකම්

3.1.1 අවසර නොලත් මූල්‍ය ව්‍යාපාර වලට එරෙහිව ගත් ක්‍රියාමාර්ග

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ සිට පොදු ව්‍යාපාර කමිටුව සහ මුදල් මණ්ඩලය විසින් ලබාදී තිබුණු නියෝග පදනම් කර ගෙන බැංකු නොවන මූල්‍යායතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අවසර නොලත් මුදල් ව්‍යාපාර සම්බන්ධයෙන් විමර්ශන කටයුතු මෙහෙයවා තිබුණි. මේ දක්වා ක්‍රියාවට නංවන ලද විමර්ශන 65 අතරින් පහත ප්‍රගතීන් වාර්තා විය.

(i) විමර්ශන 46 ක් අවසන් කර තිබුණි.

(ii) තවදුරටත් කටයුතු කිරීම සඳහා විමර්ශන 3 ක් ඉතිරිව තිබූ අතර විමර්ශන 1 ක් නීතිමය කටයුතු කිරීම සඳහා නීතිපති වෙත යොමු කර තිබුණි.

(iii) අමතර සිද්ධීන් 06 ක් ද අවසන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් නීතිපතිගේ උපදෙස් ලැබී තිබූ අතර තවදුරටත් පැහැදිලි කරගැනීම් කළ යුතුව තිබුණි.

(iv) සිද්ධීන් 24 ක් විමර්ශන තත්වයේ පැවතුණි.

බොහොමයක් සිද්ධීන්හි විමර්ශන කටයුතු 2008 හා 2009 වර්ෂවල ආරම්භ කර තිබූ අතර සියයට 37 ක ප්‍රමාණයක් කෙරීගෙන යමින් තිබුණි. විමර්ශන කටයුතු වල ප්‍රගතිය මන්දගාමීව පැවතීම, අවසර නොලත් මූල්‍ය ව්‍යාපාර වලට ගනු ලබන පියවරයන්ට අයහපත් ලෙස බලපානු ඇත.ඒ අනුව පවතින විමර්ශන ක්‍රියාවලිය ඵලදායි නොවන බව පෙනී යයි.

(ආ) තවද,මූල්‍ය සමාගම් පනතේ නියමයන්ට පටහැනිව මූල්‍ය ව්‍යාපාර වල නිරත සමාගම් ආයතනයක් වශයෙන් එහි නම සහ ලියාපදිංචි ලිපිනය පුවත්පත්වල ප්‍රසිද්ධ කළ යුතු යයි බැංකු නොවන මූල්‍යායතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් උපදෙස් දී තිබූ අතර සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි.එම සමාගම 2013 සැප්තැම්බර් දක්වා මුදල් මණ්ඩලය විසින් නිකුත් කර තිබූ උපදෙස් වලට අවනත නොවී තිබියදීත් බැංකු නොවන මූල්‍යායතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව එම සමාගමට එරෙහිව තවදුරටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව විගණනයේදී අනාවරණය විය.

(ඈ) ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්‍රමයේ ස්වාධීතාවය සඳහා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වල බලපෑම වටහා ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය අංශය නියාමනය කිරීමේ හා අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් පිහිටුවීමේ අවශ්‍යතාව ඉටුකිරීමට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා නීතිමය රාමුවක් පිහිටුවීමේ අරමුණින් කෙටුම්පත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමන පනතක් අනුමත කිරීමට 2006 පෙබරවාරි 07 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි.තවද, 2009 අගෝස්තු 17 දින පැවැත්වූ මූල්‍ය මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය හා අධීක්ෂණය සඳහා ස්වාධීන නියාමන හා අධීක්ෂණ අධිකාරියක් ස්ථාපිත කිරීම අනුමත කර තිබුණි. එම තීරණ පදනම් කරගෙන, කෙටුම්පත් ක්ෂුද්‍ර මූල්‍ය පනත අවසන්කර එම පනත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි.පසුව 2013 සැප්තැම්බර් මාසයේදී ව්‍යවස්ථාදායක කරුණු සම්බන්ධව අමාත්‍ය මණ්ඩල අනු කමිටුව, ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පැවැත්වූ සාකච්ඡාවේදී එම කමිටුව විසින් යෝජනා කරන ලද පරිදි විකල්ප නියාමන රාමුවක් ක්‍රියාත්මක කරන තෙක් අදාල පනත ක්‍රියාත්මක නොකර තැබීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර තිබුණි.විගණනය සඳහා ලැබී තිබුණු තොරතුරු අනුව, ක්ෂද්‍ර මූල්‍ය අංශය ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනයට යටත් නොවන්නේ නම් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ස්ථාවර භාවය පාලනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවට අපහසු වේ.කෙසේ වෙතත්, මුදල් නීති පනත අනුව රට තුළ මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වගකිව යුතු වේ. එසේම යෝජිත ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ අවසර නොලත් මූල්‍ය ව්‍යාපාර නියාමනය කිරීමේ අදහසින් බැංකු නොවන මූල්‍යායතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව එවැනි ව්‍යාපාරවලට එරෙහිව මෙහෙයවන ලද විමර්ශන තාවකාලිකව අත්හිටුවා තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ග්‍රාමීය ප්‍රදේශයන්වල ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු නැංවීමට අවධානය යොමු කර තිබෙන අතර රට තුළ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර ආරම්භ කිරීමේ වැඩි නැඹුරුතාවයක්ද පවතී. එම පසුබිම යටතේ, යෝජිත පනත අවසාන අදියරට පැමිණ වර්ෂ 7 ක් ගතවී තිබෙන නමුත් බල ගැන්වීමකින් තොරව නවත්වා ගැනිම ප්‍රශ්නකාරී වේ. කෙසේ වෙතත් නව පනත සම්බන්ධ නීතිමය ක්‍රියාවලිය අදාල ආයතනනවල සාමාන්‍ය ක්‍රියාවලිය යටතට වැටෙන අතර ව්‍යවස්ථාදායක කරුණු සම්මත කර ගැනීමේ මෙම අදියරේදී ශ්‍රී ලංකා මහ බැංකුවට විශේෂිත පාලනයක් සිදුකළ නොහැකි බව ශ්‍රී ලංකා මහ බැංකුව දන්වා තිබුණි.

3.1.2 අසාර්ථක මූල්‍ය සමාගම් අධීක්ෂණය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1998 - 2000 කාලය තුළ පීඩාවට පත් මූල්‍ය සමාගම් 13 ක් සඳහා ලබාදුන් ණය සහ ප්‍රති මූල්‍ය පහසුකම් වටිනාකම වූ රු.බිලියන 6.1 ක් ලියා හැරීමට 2011 මාර්තු 21 දින මුදල් මණ්ඩලය අනුමැතිය ලබාදී තිබුණි. පසුව ඈවර කිරීමේ ක්‍රියාවලියට බදුන්ව තිබුණු සමාගම් හයකින් ඒවායේ බෙදාහැරීම් සිදුකරන විටදී මුදල් අයකර ගැනීමට 2011 සැප්තැම්බර් 01 දින මුදල් මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, 2013 සැප්තැම්බර් අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අයකර ගෙන තිබුණේ රු.මිලියන 18.4 ක් පමණි. පොදු ව්‍යාපාර කමිටුව අදාල සමාගම් වල අධ්‍යක්ෂවරුන්

වෙත විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස නියෝග කර තිබුණු නමුත් 2013 සැප්තැම්බර් අවසානය දක්වා එම පියවර ගෙන නොතිබුණි.

ශ්‍රී ලංකා මහබැංකුව විසින් අසාර්ථක මුල්‍ය සමාගම් පිළිබඳ යෝග්‍යතා වාර්තා නීතිපති වෙත ඉදිරිපත් කර ඇති බවත් සිහිකැඳවීම් ද යවා ඇති බවත් ,ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් මා වෙත දැනුම් දෙන ලදී. 1988/89 දී මුල්‍ය සමාගම් වෙනුවෙන් නියාමන කිරීමේ යාන්ත්‍රණයක් සඳහා විශේෂ නීතිමය රාමුවක් නොතිබුණි . ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවති පුළුල් මුල්‍ය/ආර්ථික ස්ථායිතාවය පිළිබඳ වගකීම සැලකිල්ලට ගැනීමේදී අසතුටුදායක සදාචාරාත්මක පිරිහීම පිළිබඳ අර්බුදයෙන් අලාභය පිළිබඳ තැන්පත්කරුවන්ගේ විශ්වාසය ආරක්ෂාකරගැනීමට එවකට පැවති විශේෂිත හේතු /සිදුවීම් සලකා ප්‍රතිමුල්‍ය පහසුකම් ඇතුළු විවිධ පියවර ගෙන තිබුණි.එම අසාර්ථක මුල්‍ය සමාගම්වල අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මුල්‍ය සමාගම් පනතේ විශේෂිත බලතල නොතිබුණි.පෙර නියාමන කිරීමේ යාන්ත්‍රණයක් නොතිබීම හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ග සාමාන්‍ය නීතිය යටතේ ගතයුතුව තිබුණි.එම නිසා නීතිපතිට වුවද එවන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නිතිමය ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ.තවද, අදාල කාර්යයේ නියුතුව සිටි එම අධ්‍යක්ෂවරුන් මෙන්ම නිලධාරීන් වර්තමානයේ ජීවතුන් අතර නොසිටීමට හෝ සොයාගැනීමට නොහැකිවීමට පුළුවන. එවන් නීතිමය බාධාවන් නිසා නීතිපති විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එමනිසා මෙම අවස්ථාවේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රායෝගික නොවන අතර එය රාජ්‍ය අරමුදලට පිරිවැයක්ද වේ.

(ආ) තැන්පතු කරුවන්ට ගෙවිය යුතු වගකීම රු.බිලියන 3.5 ක් වූ මුල්‍ය සමාගමක් සමාලෝචිත වර්ෂය තුළදී බංකොලොත් භාවයට පත් විය. විගණනයට ලැබී ඇති තොරතුරු අනුව මෙම සමාගම අධීක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බැංකු නොවන මුල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2009 වර්ෂයේදී මේ සම්බන්ධ විමර්ශනයක් සිදුකර තිබුණි. කෙසේ වෙතත්, විමර්ශනය සම්බන්ධ ලිපි ගොනු දෙපාර්තමේන්තුව විසින් අස්ථාන ගතකර තිබුණු අතර මුදල් මණ්ඩලයට වාර්තා කිරීම සම්බන්ධ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ii) 2011 වර්ෂයේදී තවත් විමර්ශනයක් සිදුකර තිබුණි. බොල් සහ අඩමාණ ණය වෙන්කිරීම්, ද්‍රවශීලි වත්කම් අවශ්‍යතාවය පවත්වා ගැනීම, උපචිත පොලිය ආදායම් ගත කිරීම, ඒක පුද්ගල ණය සීමාව උල්ලංඝණය කිරීම, වාර්තාකරණ අවශ්‍යතාවයන්, සාවද්‍ය මුදල් හා බැංකු ශේෂ වාර්තා කිරීම යන කරුණු මුදල් මණ්ඩලය වෙත වාර්තා කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමට එරෙහිව ගනු ලැබූ පියවරයන් පිළිබඳ විස්තර විගණනයට වාර්තා කර නොතිබුණි.

(iii) 2012 නොවැම්බර් මාසයේදී පසු විමර්ශණ සිදුකර තිබුණු අතර මුදල් මණ්ඩලය වෙත බරපතල විෂමාචාරයන් වාර්තා කර තිබුණි. ඍණ වත්කම් පදනමක් පැවැත්වීම, රු.මිලියන 632.38 ක් වූ සම්බන්ධිත පාර්ශව ගණුදෙනු, සමූහයේ

සභාපතිවරයා වෙනුවෙන් කොටස් මිලදී ගැනීමට ප්‍රථම මහජන නිකුතුවෙන් රු.මිලියන 48.45 ක් යොදා ගැනීම, වටිනාකම රු.මිලියන 228.6 ක් වූ ව්‍යාජ වත්කම් ගිණුම්ගත කිරීම, ස්ථාවර තැන්පතු මත පොලිය ලෙස රු.මිලියන 18.28 ක් වැඩිපුර ගෙවීම වැනි විස්තර වාර්තා කර තිබුණි.

(iv) ඉහත සඳහන් කරුණු පදනම් කරන ගෙන අරමුදල් අයථා පරිහරණය සම්බන්ධයෙන් ප්‍රධාන විධායක නිලධාරියාට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට, මව් සමාගම සහ සම්බන්ධිත පාර්ශ්වයන් විසින් අත්කරගත් වත්කම් මාරුකිරීම සඳහා අදාල පාර්ශ්වයන් වෙත දැනුම් දීමට, සියළු අධ්‍යක්ෂවරුන්ගේ පරිශ්‍රමිකයන් අඩු කිරීමට, නව ප්‍රාග්ධනය යෙදවීමේ කැමැත්ත මත නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමට සහ 2011 මුදල් ව්‍යාපාර පනතේ 25(1)(එෆ්) වගන්තිය යටතේ වෙනත් මූල්‍ය සමාගමක් කළමනාකරණ නියෝජිතයා ලෙස පත්කිරීම යන කරුණු වලට අවධානය යොමු කරමින් මුදල් මණ්ඩලය නියෝග නිකුත් කර තිබුණි.

(v) 2012 නොවැම්බර් මාසයේදී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව ලබාදුන් නියෝග වලින් බැහැරවූ අවස්ථා රාශියක් සම්බන්ධයෙන් 2009 වර්ෂයේ සිට ස්වාධින විගණකයින්ද වාර්තා කර තිබුණි. විශේෂයෙන්ම රු.මිලියන 1,500 කට වැඩි මුදලක් මව් සමාගමේ ආයෝජනය කිරිම, අධ්‍යක්ෂවරුන් සහ වෙනත් සම්බන්ධිත පාර්ශ්ව වලට ගෙවීම්, ද්‍රවශීලි වත්කම් අවශ්‍යතාවය සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම් පත්වල ආයෝජන අවශ්‍යතා සහ බොල් සහ අඩමාණ ණය සඳහා වෙන්කිරීම් යනාදි කරුණු අවධාරණය කර තිබුණි.

## 3.2 ප්‍රාදේශීය සංවර්ධන කටයුතු

ක්ෂුද්‍ර මූල්‍ය, ක්ෂුද්‍ර සහ මධ්‍යම මට්ටමේ ව්‍යාපාර, කෘෂිකාර්මික වැනි විවිධ ප්‍රාදේශීය සංවර්ධන අංශ සඳහා පිහිටුවා තිබූ චක්‍රිය අරමුදල් සහ ණය යෝජනා ක්‍රම හරහා සහභාගිත්ව ණයදෙන ආයතන වෙත ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව නොකඩවා කරගෙන යනු ලබයි. ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන ප්‍රකාර චක්‍රිය අරමුදල්/ ණය යෝජනා ක්‍රම 24 ක් සඳහා රු.බිලියන 28.4 ක් සපයා පසුගිය වර්ෂයන් ඇතුලත අවසන් කර තිබූ අතර චක්‍රිය අරමුදල්/ ණය යෝජනා ක්‍රම 20 ක් පවත්වාගෙන යනු ලබයි. පවත්වාගෙන යනු ලබන චක්‍රිය අරමුදල්/ ණය යෝජනා ක්‍රම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වෙන් කර තිබූ මුදල රු.බිලියන 18.8 කි.එක් එක් චක්‍රිය අරමුදල්/ ණය යෝජනා ක්‍රම සඳහා වාර්ෂිකව වෙන් වෙන්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(අ) චක්‍රිය අරමුදල්/ ණය යෝජනා ක්‍රම වෙන් වශයෙන් නොකඩවා කරගෙන යනු ලැබුවද අපේක්ෂිත ආකාරයෙන් ව්‍යාපෘති මෙහෙයුම් කාර්යසාධනය පිණිස වෙන්ව ව්‍යාපෘතිවල ප්‍රතිඵල අගය කර නොතිබුණි. එසේ වුවත් ගිවිසුමේ එවන් කොන්දේසියක් දක්වා තිබුණහොත් ව්‍යාපෘති අවසන් කිරීමේදී විදේශ ආධාර ව්‍යාපෘති සඳහා පමණක් එහි ප්‍රතිඵල අගයන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් දැනුම් දෙන ලදී. ප්‍රතිලාභීන්ගේ සමාජ ආර්ථික සංගණනයක් කිරීමට වෙනම පිරිවැයක් දැරීම ප්‍රතිඵල ඇගයීම හා සම්බන්ධ වේ.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා චක්‍රිය අරමුදල් /ණය යෝජනා ක්‍රම 20 හි තථ්‍ය මුල්‍ය කාර්යසාධනය අයවැය ප්‍රතිපාදන සමග සැසඳීමේදී සමහර චක්‍රිය අරමුදල් /ණය යෝජනා ක්‍රම, අදාල පාර්ශවයන් වෙත ප්‍රතිමූල්‍ය ණය වියපැහැදම් කිරීමේ ප්‍රගතිය සතුටුදායක තත්වයක් පෙන්නුම් නොකරයි. එවැනි චක්‍රිය අරමුදල් /ණය යෝජනා ක්‍රම පිලිබඳ විස්තර පහත දැක්වේ.

| **චක්‍රිය අරමුදල /ණය යෝජනා ක්‍රමය** | **අයවැය ප්‍රතිපාදන 2012 වර්ෂය සඳහා** | **2012 දෙසැම්බර් 31 දිනට මුළු වියපැහැදම** | **වෙනස** | |
|---|---|---|---|---|
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **%** |
| පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය | 530 | 340 | 190 | 36 |
| දිළිඳුකම පිටුදැකීම සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘතිය - II | 904 | 652 | 252 | 28 |
| කෘෂිකාර්මික අංශය සඳහා බලපත්‍රලාභී ණය (විස්කම්) ණය යෝජනා ක්‍රමය | 744 | 524 | 220 | 30 |
| තේ සංවර්ධන ව්‍යාපෘතිය චක්‍රිය අරමුදල (ටීඩීපී-ආර්එෆ්) | 300 | 131 | 169 | 56 |

## 3.3 මුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව ඉහළ අගයකින් යුත් කාසි ප්‍රතිචක්‍රීකරණය කර ආදායමක් ඉපයීමේ අරමුණින් ඉහළ අගයකින් යුත් රු.5 හා රු.2 කාසි ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ව්‍යාපෘතියක් 2007 දී හා 2008 වර්ෂවලදී ආරම්භ කර තිබුණි.එසේ වුවත්, මිලියන 10.75 ක කාසි අතරින්,පිළිවෙලින් රු.5 හා රු.2 ඉහළ අගයකින් යුත් කාසි මිලියන 3.25 ක් සහ මිලියන 2.39 ක් 2012 දෙසැම්බර් 31 දිනට නොවිකුණා පැවතුණි. ජාත්‍යන්තර ලෝහ මිල ගණන් ඉහළ මට්ටමක් දක්වා වැඩිවනතුරු

ප්‍රතිචක්‍රීකරණය නොකර සිටීමට තීරණය කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් මා වෙත දැනුම් දෙන ලදී.

(ආ) සමහර සමරු කාසි තොග සංචලනය ඉතා සෙමින් සිදුවන බව නිරීක්ෂණය වූ අතර ඉන් පෙනී යන්නේ ඒ සඳහා මහජන ඉල්ලුම පහළ මට්ටමක තිබූ බවය.2012 දෙසැම්බර් 31 දිනට සුරක්ෂිතාගාරයේ වූ එවැනි සමරු කාසිවල තොග තත්වය පහත දැක්වේ.

| විස්තරය | නිකුත් කළ වර්ෂය | මුහුණත අගය රු. | ටංකනය කළ කාසි ප්‍රමාණය | 2012 දෙසැම්බර් 31 දිනට සුරක්ෂිතාගාරයේ වූ කාසි ප්‍රමාණය |
|---|---|---|---|---|
| 2500 බුද්ධ ජයන්තිය | 1957 | 5 | 500,000 | 20,168 |
| ආර්.ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තියේ 3 වැනි සංවත්සරය | 1993 | 1 | 2,500 | 803 |
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 50 වන සංවත්සරය | 1995 | 5 | 5,000 | 3,959 |
| ශ්‍රී ලංකාවේ 50 වැනි නිදහස් සංවත්සරය | 1998 | 1,000 | 25,000 | 6,685 |
| ලෝක ක්‍රිකට් කුසලානය-1996 | 1999 | 1,000 | 25,000 | 10,164 |
| 2550 බුද්ධ ජයන්තිය | 2006 | 2,000 | 10,000 | 8,444 |
| 2550 බුද්ධ ජයන්තිය | 2006 | 1,500 | 20,000 | 18,697 |
| ලෝක ක්‍රිකට් කුසලානය-2007 | 2008 | 1,000 | 10,000 | 8,007 |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙක් වෛද්‍යාධාර ක්‍රම තුන යටතේ එම නිලධාරීන්ට සහ විශ්‍රාමිකයන්ට අයදුම් කළ හැකි උපරිම මුදල ඉක්මවන හදිසි තදබල අසනීප, විශාල ශල්‍ය කර්ම හා දිගුකාලීන රෝගී තත්වයන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට ප්‍රතිකාර සඳහා අවශ්‍ය මූල්‍යාධාර ප්‍රදානය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකු සේවක සහ විශ්‍රාමික ආපදා සහන අරමුදල පිහිටුවා තිබුණි.ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචලනය නොවන වත්කම් විකිණීමෙන් මුදල් මණ්ඩලයේ අනුමැතිය යටතේ මාරු

කරනු ලබන මුදල්,පාවිච්චි කළ නොහැකි අයිතම විකිණීම,පරිත්‍යාග, සාමාජිකයන්ගේ ඇතුලත්වීමේ ගාස්තු හා ආයෝජන ආදායම් මගින් ශ්‍රී ලංකා මහ බැංකු සේවක සහ විශ්‍රාමික ආපදා සහන අරමුදල සඳහා එකතු කිරීම් කරනු ලබයි. සුභසාධන අධ්‍යක්ෂ අරමුදල සඳහා වෙනම ගිණුමක් පැවැත්විය යුතුවේ. 2012 දෙසැම්බර් 31 දිනට අරමුදලෙහි මුළු දායකය රු.මිලියන 40.18 ක් වූ අතර සාමාජිකයන් ගණන විශ්‍රාමිකයන් 874 ක් සහ සේවයේ සිටින්නන් 846 ක්ව පැවතුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා මහ බැංකු සේවක සහ විශ්‍රාමික ආපදා සහන අරමුදලේ රීති අනුව සුභසාධන අධ්‍යක්ෂ,වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකරණ විගණන අධ්‍යක්ෂ විසින් විගණනය කළ යුතු අතර,විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ අතර විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත්කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ii) අරමුදල එහි ආරම්භයේ සිට බලාපොරොත්තු වූ අරමුණු සඳහා අරමුදල් භාවිතා කර නොතිබූ අතර මුළු දායකය වන රු.මිලියන 40.18 ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබුණි.

2006 ජුනි 15 දිනැති මුදල් මණ්ඩල තීරණය ප්‍රකාර අරමුදලේ ප්‍රමාණය රු.මිලියන100 ට ළඟා වන තුරු එම අරමුදල් භාවිතා නොකළ යුතු බවට,අරමුදල භාවිතා නොකිරීමට විශේෂිත හේතුව බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් මා වෙත දැනුම් දෙන ලදී. එසේ වුවත්, නව සාමාජිකයන් සහ වෙනත් මාර්ග සමග කාලීනව අරමුදල වැඩිකරගැනීමට සහ ප්‍රාග්ධනය පවත්වාගැනීම සඳහා එම සීමාව රු.මිලියන 30 දක්වා අඩුකිරීමට මුදල් මණ්ඩලය 2013 දී තීරණය කර තිබුණි. එම නිසා අරමුදල රු.මිලියන 30 ඉක්මවන අතර සුදුසුකම් ඇති සාමාජිකයන්ට මූල්‍ය සහන ලබාදිය හැකිය. අරමුදලේ ආරක්ෂාව සඳහාත් අරමුදලට පොළියක් උපයාගැනීමටත් හිඟ අරමුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබුණි.

(ආ) 1997 අංක 24 දරන දේශීය ආදායම් සංශෝධන පනතේ ප්‍රතිපාදන සහ පොදු ව්‍යාපාර කමිටුව විසින් දී තිබූ උපදෙස්වලට පටහැනිව පුරුද්දක් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදීද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි කාර්ය මණ්ඩල සාමාජිකයන්ට උපයනවිට බදු ගෙවා තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි සේවකයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී සහ ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් එකතුව රු.මිලියන 138.9 ක් සහ රු.මිලියන 108.8 ක් උපයනවිට බදු ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවයේ යෙදී සිටි සේවකයන් 1,495 ක් සහ විශ්‍රාමික සේවකයන් 1,983 ක් ද විය.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මධ්‍යම ගොඩනැඟිල්ල නවීකරණ සඳහා උපදේශක ආයතන වලින් මිල කැඳවීම් කර තිබුණු අතර ඊට ප්‍රතිචාර දැක්වූ ආයතන 14 ක් අතුරින් සුදුසුකම්ලත් ආයතන 09 ක් තෝරාගෙන තිබුණි. තෝරා ගැනීමේ ක්‍රමවේදයෙන් බැහැරව මිල කැඳවීම් සඳහා ප්‍රතිචාර දක්වා නොතිබුණු ආයතනයන් එය තෝරා ගැනීම සඳහා කිසිඳු සාධාරණ පදනමකින් තොරව, නවීකරණ කටයුතු සඳහා උපදේශකවරුන් ලෙස තෝරා ගෙන තිබුණි. තවද, 2013 මාර්තු දක්වා එම ආයතනයට රු.12,014,920 ක මුදලක් ගෙවා තිබුණි. අළුත් වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම පිළිබඳ තෝරාගත් උපදේශක සමාගම වගකිව යුතු අතර ඔවුන්ගේ පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 571 ක් විය. කෙසේ වෙතත්, එම ඇස්තමේන්තුව පසුව වෙනස් කර රු.මිලියන 300 දක්වා අඩුකර තිබුණි.එමනිසා, මෙම පිරිවැය ඇස්තමේන්තුවේ නිරවද්‍යභාවය මෙන්ම තෝරාගත් ආයතනයේ වෘත්තීයමයභාවයද ප්‍රශ්නකාරී වේ. පසුව, පිරිවැය ඇස්තමේන්තුව වූ රු.මිලියන 300, රු.මිලියන 175 කින් වැඩිකර තිබුණි. කෙසේ වෙතත් විස්තරාත්මක පිරිවැය ඇස්තමේන්තුව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ටෙන්ඩර් කැඳවීමක් හෝ පිරිවැය ඇස්තමේන්තුවක් හා ප්‍රමාණ පත්‍ර නොමැතිව ලොයිඩ්ස් ගොඩනැඟිල්ලේ බිම සඳහා ටයිල් ඇතිරීම රු.5,078,514 ක පිරිවැයකට ඉටුකර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සෝමාවතී ජාතික උද්‍යානය තුළ සංචාරක බංගලාවක් ඉදිකර තිබුණි. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ වූ අවබෝධතා ගිවිසුම ප්‍රකාර බංගලාවේ ඉදිකිරීම්, සංවිධානය කිරීම් හා නඩත්තු කටයුතු සහයෝගයෙන් ඉටුකිරීමට එකිනෙකා එකඟ වී තිබුණු අතර බංගලාව සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හා වන ජීවී කාර්යාලය පිළිවෙලින් එකතුව රු.මිලියන 59.8 ක් සහ රු.මිලියන 6.2 ක් දරා තිබුණි. බදු කාලය වර්ෂ 30 කට පසු ගොඩනැගිල්ල වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මාරු කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව නඩත්තු කළ වාර්තා අනුව බංගලාව අවස්ථා 52 ක දී භාවිතා කර තිබූ අතර රු.386,500 ක් නවාතැන් වියදම් වශයෙන් උපයාගෙන තිබුණි.

3.6 මතභේදයට තුඩුදුන් කරුණු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රටේ විදේශ වත්කම් තත්ත්වය පිරිහීමේ අවදානම ආවරණය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව, මැලේසියානු මහ බැංකුව සමඟ විනිමය හුවමාරු පිළියෙල කිරීමේ

ගිවිසුමකට එළඹ තිබුණු අතර 2009 පෙබරවාරි මාසයේදී එ.ජ.ඩොලර් මිලියන 200 ක පහසුකමක් ලබාගෙන තිබුණි. ගිවිසුම අනුව, අන්‍යෝන්‍ය කැමැත්ත මත මාස තුනකින් පසුව විනිමය හුවමාරු ගනුදෙනු අළුත් කර ගත යුතු අතර ඒ අනුව ත්‍රෛමාසිකව සිදුකළ ගනුදෙනුමත පොලිය ලන්ඩන් අන්තර් බැංකු ණය ප්‍රදාන අනුපාතය අනුව තීරණය කර ගෙවිය යුතුය. 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත ප්‍රමාණය ඉහල ගොස් තිබුණද එම ගිවිසුම අවසන් කිරීම ගැන නොසලකා, 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විනිමය හුවමාරු ගනුදෙනු මත පොළිය වශයෙන් රු.මිලියන 824.6 ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වැයකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.මෙම ගිවිසුම 2013 පෙබරවාරි 09 දින අවසන් වන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් මා වෙත දැනුම් දෙන ලදී.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් වාහන හා නිලධාරීන්ගේ වාහන ගාල් කිරීම සඳහා ට්‍රාන්ස්වර්ක්ස් චතුරශ්‍රයේ පර්චස් 133.98 ක ඉඩමක් වර්ෂ 99 ක් සඳහා බදු පදනම මත 2000 ජුනි 02 සිට ක්‍රියාත්මක වන පරිදි රු.100,485,000 ක මුදලක් දරමින් ලබාගෙන තිබුණි. පසුව, බදු ගිවිසුම අවලංගු කිරීමකින් තොරව, විදේශීය ආයෝජකයකුගේ සංවර්ධන ව්‍යාපෘතියන් ක්‍රියාත්මක කිරීම සඳහා එම ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආපසු අයකර ගෙන තිබුණි. බදු මුදල නිරාකරණය කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ නව ගිවිසුමකට එළඹ නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට බදු ඉඩමේ පොත් අගය රු.88,558,750 ක් විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇස්තමේන්තුව අනුව ඉඩමේ වෙළඳ පල මිල රු.මිලියන 1,200 ක් පමණ වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගිවිසුම් වලට අවිනිශ්චිතව එළඹීම හේතුවෙන් අයකරගත යුතු මුදල නාගරික සංවර්ධන අධිකාරියෙන් හෝ ආයෝජකයාගෙන් අයකර ගැනීම සැක සහිත වේ.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව රජයේ තක්සේරුවක් පදනම් කර ගනිමින් රු.මිලියන 500 මිලකට කොළඹ 01 බාරොන් ජයතිලක මාවතේ පිහිටි (වයිට් අවේස් ගොඩනැඟිල්ල) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් මිලදී ගෙන තිබූ අතර, එම ගොඩනැඟිල්ල නවීකරණය සඳහා රු.මිලියන 13.67 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වෙතත්, මිලදී ගැනීමෙන් වර්ෂයක් ගතවී තිබුණු නමුත් 2013 ඔක්තෝබර් අවසානය වන විටත් ගොඩනැඟිල්ලේ නෛතික අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරු කර නොතිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලයේ තීරණය පරිදි මෙම ගොඩනැඟිල්ල අත්පත් කර ගෙන ඇත්තේ අවදානම් කළමනාකරණය කිරීම සඳහා වෙනත් ස්ථානයක් අමතර පරිශ්‍රයක් වශයෙන් පවත්වා ගැනීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සමහර දෙපාර්තමේන්තු වල පහසුකම් වැඩි කිරීම සඳහා වේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැඟිල්ලේ සහ දැනටමත් අත්කර ගෙන තිබෙන අනෙකුත් ගොඩනැඟිලි දෙකක අමතර ගොඩනැඟිලි ඉඩකඩ තවදුරටත් ලබාගත හැකිවීමේ පසුබිම මත අවදානම් කළමනාකරණය කිරීම සඳහා වෙනත් ගොඩනැඟිල්ලක් අත්කර ගැනීම ප්‍රශ්නකාරී කරුණක් වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍ය හා දිගු කාලීන පහසුකම් පුළුල් කිරීම සඳහා ගොඩනැඟිල්ල අත්පත් කර ගෙන තිබෙන බව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපති විසින් මා වෙත දන්වන ලදී.

(ඇ) 2011 ජනවාරි 10 දින මුදල් මණ්ඩලය ලබා දී තිබූ අනුමැතිය පදනම් කරගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිව්යෝර්ක් හි පිහිටි ගොඩනැඟිල්ලක් එක්සත් ජනපද ඩොලර් 5,807,116 කට මිලදී ගෙන තිබූ අතර එම ගොඩනැඟිල්ලේ නවීකරණය සඳහා එක්සත් ජනපද ඩොලර් 400,000 වැයකර තිබුණි. කෙසේ වෙතත්, මුදල් නීති පනතේ 117 වගන්තියට පටහැනිව මෙම ගොඩනැඟිල්ල 2012 ජුනි 01 දින සිට ඇරඹෙන වර්ෂ තුනක කාලයක් සඳහා එක්සත් ජනපද ඩොලර් 68,000 ක මාසික කුලියකට විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත කුලියට දී තිබුණි.